# ලංසු සඳහා ආරාධනයයි

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

## ලංසු සඳහා ආරාධනයයි (IFB)

## විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා මහලේකම් කාර්යාලයට පිරිසිදු කිරීමේ හා ජැනිටෝරියල් සේවා සැපයීම

### කොන්ත්‍රාත් අංකය : UGC/Admin/05/01/II

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින් වෝඩ් පෙදෙස, අංක 20 සහ කොළඹ 08, ආනන්ද රාජකරුණා මාවත, අංක 94/10 කාර්යාල පරිශ්‍ර සඳහා පිරිසිදු කිරීමේ සහ ජැනිටෝරියල් සේවා සැපයීම සඳහා 2025 නොවැම්බර් 12 වන දින ප.ව. 3.00 දක්වා මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

02. අවශ්‍යතාවයන් පිළිබඳ සවිස්තරාත්මක විස්තර ලංසුකරණ ලිපිලේඛනයෙහි දී ඇත.

03. බලාපොරොත්තු වන සේවා කාලය දින 365 කි.

04. ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියාදමය මගින් මෙහෙයවනු ලැබේ.

05. අභිලාෂී ලංසුකරුවන්ට දුරකථන අංක 011-2685183 මගින් නියෝජ්‍ය ලේකම්/ සාමාන්‍ය පරිපාලන වෙතින් වැඩිමනත් තොරතුරු ලබාගත හැකි අතර, කොළඹ 07, වෝඩ් පෙදෙසේ, නො. 20, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාන්‍ය පරිපාලන අංශයේදී ලංසුකරණ ලිපිලේඛන පරීක්ෂා කර බැලිය හැකිය.

06. ලිඛිත අයදුම්පතක් ඉදිරිපත් කිරීමෙන් හා ශ්‍රී ලංකා රුපියල් තුන්දහසක (රු. 3,000/=) ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව, කොළඹ 07, වෝඩ් පෙදෙස, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජ්‍ය ලේකම්, සාමාන්‍ය පරිපාලන කාර්යාලයෙන් වැඩකරන දිනයන්හි කාර්යාල වේලාවන් තුළ අභිලාෂී ලංසුකරුවන්ට ඉංග්‍රීසි බසින් වන ලංසුකරණ ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් මිලදී ගත හැකිය. සියලුම ගෙවීම් සරප් නිලධාරී වෙත මුදලින්ම කළ යුතුය.

07. රාජ්‍ය ආයතන හැර අනෙක් සියලුම ලංසුකරුවන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අනුමත කළ ශ්‍රී ලංකාවේ පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් ශ්‍රී ලංකා රුපියල් හැට දහසක (රු. 60,000/-) සුරැකුම් තැන්පතුවක් ඉදිරිපත් කළ යුතුය. (ලංසු සුරක්ෂණය 2026 පෙබරවාරි 24 දින තෙක් වලංගු විය යුතුයි.)

08. ඒ අනුව, පිරිසිදු කිරීමේ හා ජැනිටෝරියල් සේවා සැපයීමට බලාපොරොත්තු වන පාර්ශ්වයන් පිරිසිදු කිරීමේ හා ජැනිටෝරියල් සේවා පිළිබඳ සියලුම විස්තර සමග ලංසු ඉදිරිපත් කළ යුතුය. ලංසු ඉදිරිපත් කිරීමේදී අනු පිටපතකින් යුතුව පිළියෙල කොට **"මුල් පිටපත"** හා **"දෙවන පිටපත"** ලෙස සඳහන් කොට වෙන් වෙන්ව මුද්‍රා තැබූ කවර දෙකක බහා එම කවර දෙකම තනි කවරයක ඇතුළත් කොට මුද්‍රා තබා ඉදිරිපත් කළ යුතුය.

09. ලංසු බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ **"පිරිසිදු කිරීමේ හා ජැනිටෝරියල් සේවා සැපයීම"** යනුවෙන් සඳහන් කළ යුතුය.

10. ලංසු 2025 නොවැම්බර් 12 දින පෙ.ව. 3.00 ට හෝ ඊට පෙර, කොළඹ 07, වෝඩ් පෙදෙස, නො. 20, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති වෙත ගෙනැවිත් භාරදිය යුතුය. ප්‍රමාද ලංසු හා විද්‍යුත් තැපැලෙන් එවන ලංසු භාර නොගැනේ.

11. ලංසු භාර ගැනීමේ අවසන් වේලාව ඉකුත් වූ වහාම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, නව අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේ දී එම අවස්ථාවට සහභාගී වූ ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේ දී ලංසු විවෘත කරනු ලැබේ.

12. මෙම ලංසු පිළියෙල කිරීම හා ගෙනැවිත් භාරදීම සම්බන්ධයෙන් ලංසුකරුවන් දරන පිරිවැය හෝ වියදම් පිළිබඳ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වගකියනු නොලැබේ.

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව,**
**නො. 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.**
**2025 ඔක්තෝබර් 28 වන දින**